# 5 ශ්‍රේණිය පරිසරය

## 2021-2 ඒකකය

# අපි ලක් වැසියෝ

Part ii



මිනිස් සමූහයක එකතුවෙන් සකස් වන සමාජයක් තුළ ජාති ආගම් යනාදි ලෙස විවිධ ජන කොටස් සහිත සමාජ අනුබණ්ඩ ඇති වේ. එවැනි ජන සමාජයක ජන කොටස් අතර සුරක්ෂිතතාව තහවුරු කිරීමට නම් ඒ ඒ ජන කොටස්වල සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ අවබෝධයකින් යුතු ව එම සංස්කෘතික තත්ත්වයන් අගය කරන අන්‍යෝන්‍යතායට ගරු කරන ඒවා රැක ගැනීමට දායක වන දේශීයත්වයට මුල් තැනක් දෙන සහජීවනයෙන් කටයුතු කරන ජන සමූහයක් නිර්මාණය විය යුතු ය. කුඩා කල සිට ම සිසුන්ට එම හුරුව ලබා දී එවැනි උත්තරීතර ජන සමාජයක් නිර්මාණය කිරීමට මෙම තේමාව සැලසුම් කොට ඇත.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



Online Class details – WhatsApp 071 - 9020298

- පහත දී ඇති විවිධ ආගම් වල ආගමික උත්සව ලියන්න.

1. බෞද්ධ - ..........................................................................................................

   ..........................................................................................................

2. ක්‍රිස්තියානි - ..........................................................................................................

   ..........................................................................................................

3. හින්දු - ..........................................................................................................

   ..........................................................................................................

4. ඉස්ලාම් - ..........................................................................................................

   ..........................................................................................................

- පහත දී ඇති විවිධ ආගම් වල ආගමික සංකේත සහ ආගම හඳුනාගෙන නම් කරන්න.






..........................................................................................................................................

..........................................................................................................................................

- අපේ ජාතික වීරවරයන් හඳුනා ගනිමු.

1. ..........................................................................................



නිදහස් සටනේ ප්‍රධානතම සෙන්පතියකු වූ ගොංගාලේගොඩ බණ්ඩාගේ මුල් නාමය වූයේ දාවිත් හෙවත් ඩේවිඩ් ය. අලුදෙණියේ බණ්ඩා, කපුරුබස්ති බණ්ඩලාගේ ඩේවිඩ්, දොන් පුල්ලේ වෙදරාල ආදි නම්වලින් හැඳින්වූයේ ද මොහු ම ය.

වර්ෂ 1843 පමණ කාලයේ දී මොහු බදුල්ල ප්‍රදේශයේ වාසය කර ඇති අතර එහි දී ජාතිමාමක, ජාත්‍යාභිමානී, නිර්භීත සිංහලයන් සමඟ එකතු වී ඉංග්‍රීසීන්ට විරුද්ධ ව කටයුතු කර ඇත. එනිසා ම මොහු රාජද්‍රෝහියකු හැටියට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබිණි.

තමා රාජසිංහ පවුලට නෑකම් ඇත්තකු බව ප්‍රකාශ කරමින් මහනුවර දළදා මාලිගාවේ වාසය කර ඇත. විදේශීය පාලනයට විරුද්ධව කටයුතු කිරීමේ දී එයට අවශ්‍ය පොදු ජන විශ්වාසය සහ සහයෝගය ලබා ගැනීම වැදගත් බව ඔහු විසින් අවබෝධ කරගෙන තිබුණි.

ඉංග්‍රීසීන් විසින් අය කරන ලද අසාධාරණ බදු අහෝසි කරවා ගැනීමට සිංහල ජනතාවට අවශ්‍ය විය. එසේ ම ඉංග්‍රීසි පාලකයන් ලංකාවෙන් පලවා හැරීමට සිංහලයන් එක් රොක් විය යුතු බව අවබෝධ කරගෙන තිබිණි. මේ අරගලයේ නායකත්වය සඳහා ගොංගාලේගොඩ බණ්ඩා පත්විය. වර්ෂ 1848 ජූලි මස 30 දින විශාල පිරිසකගේ කැමැත්ත සහ විහාරාධිපති ගිරානේගම ඉන්ද්‍රජෝති හිමිපාණන්ගේ අනුග්‍රහය ලැබිණි. ගරුතර මහා සංඝරත්නයේ ආශීර්වාදය ඇතිව ගොංගාලේගොඩ බණ්ඩා ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් තුන් සිංහලයේ ම රජු වශයෙන් ඔටුණු පළඳවා අභිෂේක කරන ලදි.

මහනුවර පැරැන්දුගල හා මාතලේ නගර ජයගෙන සිටින අවස්ථාවේ සිංහල සටන් නායකයන් අතර ඇති වූ භේද, සිංහලයාගේ යුද්ධායුධශක්තිය ප්‍රබල නොවීම ආදි හේතු නිසා සටන අඩපන විය. මෙය අවස්ථාව කරගත් ඉංග්‍රීසීන් සැඟවී සිටි ගොංගාලේගොඩ බණ්ඩා වර්ෂ 1848 නොවැම්බර් 14 දින යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවන ලදි. මෙහි දී ඉදිරිපත් කරන ලද පාපෝච්චාරණය නිසා මරණ දඬුවම ලිහිල් වී කසපහර 100ක් ගසා වර්ෂ 1849 ජනවාරි 01 දින මරණයට පත් විය. මහනුවර අභිෂේක ලත් රජු ලෙසත්, වර්ෂ 1848 විමුක්ති සටන සංවිධානය කර එය පොදු ජනතාව මගින් පණ පොවා මෙහෙයවූ වීරයකු ලෙසත් ගොංගාලේගොඩ බණ්ඩා යන නාමය ලංකා ඉතිහාසයෙහි නොමැකෙන අයුරින් සටහන් වී ඇත.

**2**. ..............................................................................................................



ගොලහෙල කැප්පෙටිපොල සහ දෙල්වල එතනහාමිගේ පුත් කැප්පෙටිපොල දිසාව වූ අතර දුව ඇහැලේපොළ කුමාරිහාමි විය.

කැප්පෙටිපොල සිය පියාගේ ඇවෑමෙන් දළදා මාළිගයේ දියවඩන නිලමේ තනතුර හෙබවී ය. මුල සිට ම ඉංග්‍රීසි ජාතීන් සමග එකට එකතුව කටයුතු කළේ ය. මේ හේතුවෙන් ඌව වෙල්ලස්ස කැරැල්ල මර්ධනය කිරීම පිණිස ඉංග්‍රීසීන් විසින් යවන ලද්දේ කැප්පෙටිපොල දිසාවේ ය. නමුත් ඔහු ඌවේ ජනතාව සමඟ එක් වී රට ජාතිය බේරා ගැනීමට ඉංග්‍රීසීන්ට විරුද්ධව සටන් කොට ජය ගත්තේ ය. ඉංග්‍රීසි ජාතිකයන් මොල්ලිගොඩ දිසාවගේ සහයෙන් කැප්පෙටිපොළ දිසාව ඇතුළු බොහෝ දෙනෙක් සිරභාරයට ගත්තේ ය. ඔහු මරණයට මුහුණ දුන්නේ එඩිතරව ය. ඔහුගේ අවසන් ඉල්ලීම වූයේ තම ගෙල එක කඩුපහරින් ගසා දමන ලෙස ය. මේ මගින් එතුමාණන් තුළ පැවති වීරත්වය හා නිර්භීත බව පිළිබිඹු වේ.

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

- විදේශ ආක්‍රමණිකයන් අප යටත් කිරීමට ගත් පියවර වෙනස් කිරීමට අපට කළ හැකි දේ.

  * රටේ සශ්‍රීකත්වය නැති කිරීම සඳහා පුලුස්සා දැමූ 'මී' ගස් නැවත සිටුවා පස සරු කිරීම
  * භේද නොමැති ව සමඟි ව වැඩ කිරීම
  * විදේශිකයන් විසින් අපට හුරුකළ මත්ද්‍රව්‍ය/මත් බීම හා දුම්වැටි වැනි වැරදි භාවිත වලින් ඈත් වීම.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

- අපේ රට යටත් කර ගත් බටහිර ජාතීන්.

..........................................................................................................................................

- මෙම බටහිර ජාතීන් පිළිබඳව කියැවෙන පහත ගීතයට සවන් දෙන්න.

(පැරණි හටන් කාව්‍යවලින් උපුටා ගැනිණි)

1. යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැඟිලා පරංගී
උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා
අන්දමත් සොඳයි කිසි බිසි ගාලා කොළඹ දී
කම්පලක් නැතත් සෙනඟක් මරාදාලා

2. නොමදින් විකුම් පාලා
සැදෙමින් යුදට ජය ලන්දේසින්
සමඟින් එ ජනරාලා
සමිඳුන් ගෙ භූමිපාලා
සියසෙන් අතින් මියැ දී ගියෝ
යුදයෙන් ඇනුම් කාලා

3. පන්නා එ ලන්දේසී //
ගෙන්නා ඔවුන් පෙන්නා බලය
පන්නා ලීය සිසී
ගෙන්නාලා ඉංග්‍රීසි //
දන්නා ඔවුන් ගෙන්නා බැඳල
සෙන්නා අයට දාසී
දුරලා සතුරු වියවුල් //
කරලා දිගාවූ බිම ලා වැජඹී
නිමලා එකින් එක දල්
දැකලා මෙ අප මිහිපල් //
සකලා සිරිත් එකලා නොකර
මැඩලා තිසී වියවුල්

- බටහිර ජාතීන්ගෙන් අප රට නිදහස් කර ගැනීමට කැප වූ නායකයින් නම් කරන්න.



..............................................

..............................................

..............................................



..............................................

..............................................

..............................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

- අපට ආවේණික විවිධ සැරසිලි සහ නිර්මාණ.





  * අපතේ යන දේ ඇසුරෙන් සකස් කරන වෙසක් කූඩු
  * නත්තල් ගස් (විවිධ හැඩ අනුව සකස් කරන ලද)
  * නිර්මාණාත්මක ව ලියන කුරාණ වැකි
  * කෝලම් චිත්‍ර
  * මඟුල් පෝරු
  * ගොක්කොළ කැටයම්
  * වේවැල්/පොල්කටු රූක් ඇසුරෙන් කරන ලද කලාත්මක දෑ
  * වෙස් මුහුණු . . . ආදිය

..............................................................................

- අපට සේවය සලසන පරිපාලන ආයතන.

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

..............................................................................

- එම ආයතන වලින් අපට සිදුවන සේවාවන්.

  * උප්පැන්න/මරණ සහතිකය ලියාපදිංචි කිරීම
  * ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා තොරතුරු ලබා දීම
  * ප්‍රාදේශීය/නාගරික මංමාවත් හා ගොඩනැඟිලි ඉදිකිරීම
  * පරිසරය පිරිසිදු කිරීම (කුණු කසළ නිසි අයුරින් බැහැර කිරීම)
  * පොදු අවශ්‍යතාවල දී සහාය දීම
  * ප්‍රදේශයේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලීම
  * රජයේ දේපළ සුරක්ෂිත කිරීම හා නඩත්තු කිරීම .



- එම ආයතන වල විවිධ තනතුරු දරන පුද්ගල්යින්.

  * ග්‍රාම නිලධාරි
  * පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි
  * කෘෂිකර්ම උපදේශක
  * සමෘද්ධි නිලධාරී

- යහළුවන් සමග එකතු වී බට්ටා පැනීමේ ක්‍රීඩාව සිදු කරන්න. මෙහිදී ඉරි ඇල්ලීමෙන්, කුසපත් ඇදීමෙන් හෝ තුණ්ඩු දැමීමෙන් සිසුන් තරග වදින පිළිවෙල තීරණය කළ හැකි අතර විවිධ හේතුව නිසා ක්‍රීඩකයන් දැවී යයි.

  * 7-8 කොටුවලට බට්ටා දමන විට දී 4-5 කොටුවට බට්ටා දමා පනින ආකාරයට කළ යුතු ය.
  * නිවැරදි ව අදාළ කොටුව තුළ බට්ටා විසි කිරීමට නොහැකි වීම දැවී යාමකි.
  * බට්ටා සිටින කොටුව පෑගීම දැවී යාමකි/ඉරි පෑගීම දැවී යාමකි. (තරගයෙන් ඉවත් වීමකි.)
  * නිවැරදි පිළිවෙළින් පැනීමට නොහැකි වීම ද දැවී යාමකි.